පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 10

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- ක්‍රිස්තියානි ධර්මය

පාසලේ නම : ..............................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 3

## I කොටස

**සැලකිය යුතුයි :**

- **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ, නිවැරදි පිළිතුර අංකය තෝරා (x) ලකුණු යොදන්න.**

---

1. යෙසායා අනාගතවක්තෘ පැවසූ ලෙස ඉපදෙන දරුවාට දිය යුතු නම වන්නේ,
   - i. එළියා ය.
   - ii. යෙසායා ය.
   - iii. ගාබ්‍රියෙල් ය.
   - iv. එම්මානුවෙල් ය.

2. ''දෙවියන් වහන්සේ අප සමඟය'' යන්නෙහි හේබ්‍රෙව් වචනය වනුයේ,
   - i. එම්මානුවෙල්
   - ii. මරනාතා ය.
   - iii. රබ්බෝනි ය.
   - iv. ක්‍රිස්ටොස් ය.

3. මට පෙරටුව ගොස් මගේ මාර්ගය පිළියෙල කරන්න...... ලෙස මලාකි දිවැසිවරයා ප්‍රකාශ කළේ,
   - i. එළියා පිළිබඳව ය.
   - ii. ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව ය.
   - iii. ස්නාවක ජොහාන් පිළිබඳව ය.
   - iv. නිකදේමුස් පිළිබඳව ය.

4. එතුමාණන් ඉසුළුවේ අපේ දුකය, දරාගත්තේ අපේ පීඩා ය.... '' මෙසේ දුක් උසුලන සේවයකයාණන් පිළිබඳ අනාවැකි පැවසුවේ,
   - i. ජෙරමියා
   - ii. යෙසායා
   - iii. මීකා
   - iv. මලාකි

5. දෙවියන් වහන්සේ කෙරෙහි විස්වාසයත්, භක්තියත් නොඅඩුව තිබුණා වූ, දේව සැලැස්ම තේරුම් ගෙන දේව අණට කීකරු වූ ද දේව දූත පණිවිඩයට අවනත විය '' මෙම ලක්ෂණ ඇත්තේ,
   - i. සෙකරියස්තුමා
   - ii. ජෝසෙප්තුමා
   - iii. මරියතුමිය
   - iv. එළිසෙබෙත්තුමිය

6. ස්නාවක ජොහාන්ගේ උපත නිමිත්තෙන් ඔහුගේ දෙමාපියන්ට අවධාරණය වූයේ කුමක් ද?
   - i. අත්හැර නොදැමීමයි.
   - ii. අසල් වැසියන්ට සවන්දීමයි
   - iii. දෙවියන් වහන්සේට කළ නොහැකි දෙයක් නැත යන්නයි.
   - iv. ඉතා සරළ ජීවිතයක් ගත කිරීමයි.

7. සෙකරියස් අයත් වංශය වන්නේ,

| | | | |
|---|---|---|---|
| i. | හෙරොද්ගේ | iii. | දාවිත්ගේ |
| ii. | අබියාගේ | iv. | ආරොන්ගේ |

8. ජුදෙව් චාරිත්‍රයට අනුව ජේසු බිළිඳු කැප කළේ දින කීයකට පසුව ද?

| | | | |
|---|---|---|---|
| i. | දින අටකට | iii. | දින දාහතරකට |
| ii. | දින හතරකට | iv. | දින හතලිහකට |

9. ජේසු උපත හා සම්බන්ධ සංකේත කිහිපයක් පහත දැක්වේ.

A. තරුව
B. එඬේරුන්
C. ශාස්තෘවරුන් / රජවරුන්
D. ගවලෙන

ඉහත සඳහන් සංකේත අතුරින් ශුද්ධ වූ මතෙව්ගේ සුබසුනේ සඳහන් වන්නේ,

| | | | |
|---|---|---|---|
| i. | A හා B ය. | iii. | B හා C ය. |
| ii. | A හා C ය. | iv. | C හා D ය. |

10. දේව මාලිගාවේ නිරන්තරයෙන් යාඥාවේ යෙදී සිටි අයෙකි.

| | | | |
|---|---|---|---|
| i. | අන්නා දිවැසිවරිය | iii. | ජොහාන් |
| ii. | සෙකරියස් | iv. | මරියා |

11. ජේසුතුමාගේ උපත සිදුවූ කාලයේ රෝම අධිරාජයාට යටත්ව තිබූ ප්‍රදේශයකි.

| | | | |
|---|---|---|---|
| i. | සමාරිය | iii. | ඉතුරය |
| ii. | ගිල්ගාල් | iv. | නප්තලී |

12. පැරණි ගිවිසුමෙහි දෙවියන් වහන්සේගේ වැඩ සිටීම සංකේතවත් වූයේ,

| | | | |
|---|---|---|---|
| i. | සුළඟ | iii. | දේදුන්න |
| ii. | වළාකුළ | iv. | ගින්න |

13. නාසරෙත්හි සිනගෝගයේ දේශනයෙන්, ශාරපත්ති වැන්දඹුවන් හා නාමන් පිළිබඳ නිදසුනක් ගෙනහැර පෑමෙන් ඉදිරිපත් කළ ජේසුස් වහන්සේගේ පණිවුඩය,

i. වැන්දඹුවගේ ඇදහිල්ල විශේෂ බවය.
ii. දේව රාජ්‍යය අන්‍ය ජාතීන්ට ද විවෘත බවය.
iii. නාමන් එලිසා වෙත පැමිණ සුවය ලැබූ බවය.
iv. ජුදා දේශයේ අන්‍ය ජාතීන් ද සිටන බවය.

14. ගෝලයන් කැඳවීමේ සිද්ධියෙන් ජේසුස් වහන්සේ අපට ඉදිරිපත් කරන පාඩම වන්නේ,

i. කැඳවීමට ප්‍රථම අප එය තෝරා ගත යුතු බව ය.
ii. සේවය අගයකොට අන් අයට දැන්වීම ය.
iii. ජේසුස් වහන්සේගේ සේවයේ පංගු කාරයන් විය යුතු බව ය.
iv. ජේසුස් වහන්සේගේ සේවයට කවුරුන් හෝ ඉදිරිපත් කළ යුතු බව ය.

15. ජේසුස් වහන්සේ විසින් කැඳවනු ලැබූ ........... අල්පෙවුස්ගේ පුත්‍රයාට මෙහි හිස්තැනට සුදුසු වන්නේ,

i. සිමොන් iii. ඇන්ඩෘ
ii. ජොහාන් iv. ජාකොබ්

16. '' වග වලසුන් මැදට බැටළු පැටවුන් යවන්නාක් මෙන් මම ඔබ යවමි.'' යන ජේසුස් වහන්සේගේ ප්‍රකාශයේ හරය වූයේ,

i. තනිව සිටින්න යන්නයි. iii. අභියෝගවලට මුහුණපාන්න යන්නයි.
ii. කණ්ඩායමක් ලෙස සිටින්න යන්නයි. iv. බලවත් වන්න යන්නයි.

17. ආබ්‍රහම්ගේ පුත්‍රත්වය හා ආබ්‍රහම්ගේ දියණිය යන නාමයන්ගෙන් ජේසුතුමා හැඳින්වූයේ,

i. නිකදෙමුස්, කුදු ස්ත්‍රිය iii. සාකෙවුස්, මහලේ රෝගී කාන්තාව
ii. අංශභාග රෝගියා, කුදු ස්ත්‍රිය iv. සාකෙවුස්, කුදු ස්ත්‍රිය

18. පරිසිවරු හා සද්දුසිවරු ජේසුස් වහන්සේ මුණ ගැසුනේ කුමක් සඳහා ද?

i. රහසිගත සාකච්ඡා පැවැත්වීමට.
ii. ඔවුන්ගේ ප්‍රශ්නවලට දේව මඟ පෙන්වීම ලබා ගැනීමට.
iii. ජේසුස් වහන්සේට අභියෝග එල්ල කිරීමට.
iv. ජේසුස් වහන්සේට සත්‍ය ගැඹුරින් තේරුම්කර දීමට.

19. මනුෂ්‍ය පුත්‍රයා සබත් දවසේ ස්වාමියා ය. කිතුණු අපතුළ ඉරුදින පිළිබඳ හරි දැක්ම විය යුත්තේ,

i. එදින විවේකීව ගත කිරීමයි.
ii. උපකාර පංතිවලට යාමයි.
iii. දේව නමස්කාරයට හා දයාවේ සේවයට මුල්තැන දීමයි.
iv. මුල් දවසම සාමූහික නමස්කාරයට යෙදීමයි.

20. යහපත් අරමුණක් සඳහා ජුදා නීති රීති ලිහිල් කළ අවස්ථාවක් වන්නේ,

i. සාකෙවුස්ගේ නිවසට වැඩම කිරීම.
ii. සමාරිත කාන්තාව සමඟ කතාබහ කිරිමය
iii. අතක් පණ නැති මිනිසා සුව කිරිම.
iv. පේදුරුගේ නැන්දණිය සුව කිරීම.

21. ''පරිසිවරුනි ඔබ කෝප්පයේ ද, පිඟානේ ද, පිටපැත්ත සෝදා පිරිසිදු කරන්නාහු ය... එහෙත් ඔබගේ ඇතුළත තණ්හාවෙන් ද දුෂ්ඨ චේතනාවෙන් ද පිරී ඇත. '' මෙහි අරුත නම්,

i. බාහිර පිළිවෙත් ගැන වුවමනාවටත් වඩා සැලකිල්ලක් දැක්වීම අනිවාර්ය බව ය.
ii. බාහිර පිළිවෙත් ගැන සැලකිල්ලක් දැක්වීමට වඩා තම ආත්මික පවිත්‍රතාවය කෙරේ වඩාත් සැලකිල්ලිමත් විය යුතු බවයි.
iii. සිත අභ්‍යන්තරයේ ඇති අකටයුතුකම් පිළිබඳව ජේසුතුමා අවධාරණය කළ සේක.
iv. සියල්ල දෝවනයෙන් පිරිසිදු කිරීම හා කරවීමට වැඩි සැලකිල්ලක් දැක්වීම අවශ්‍ය බවයි.

22. වත්මන් සමාජය තුළ ජේසුස් වහන්සේ විනිශ්චය කළ ''හේරොද් '' වැනි අය දැකිය හැකි වූයේ,

i. අන් අයගේ බලපෑම මත තම තිරණ වෙනස් කරගන්නන් ලෙස ය.
ii. තම පෞද්ගලික අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා යුක්තිය අමතක කරන්නන් ලෙස ය.
iii. තම වැරදි සඟවමින් අන් අයගේ වැරදි සෙවීමට කාලය ගතකරන්නන් ලෙස ය.
iv. අල්ලස් ලබා දී හෝ සිය අවශ්‍යතා ඉටුකරන්නන් ලෙසිනි.

23. ''ඔබ මේ දේවල් කරන්නේ කුමන අධිකාරි බලයකින්ද ? නොහොත් මේ අධිකාරී බලය පැවරුවේ කවරෙක්දැයි'' යන නායක පූජක පැණයට ජේසුතුමාගේ පිළිතුර වූයේ,

i. ''අපි නොදනිමු '' යන්නයි.
ii. ''දෙවිපියාණන් වහන්සේගේ බලයෙන්'' යන්නයි.
iii. ''එසේ නම් මමත් නොදනිමි'' යන්නයි.
iv. ''මමත් ඔබට නොකියමි'' යන්නයි.

24. දේව මාලිගාවේ බද්ධ ගෙවීමට පමණක් යොදා ගත් කාසි වර්ගයේ සුවිශේෂී භාවය වූයේ,

i. යමෙකුගේ රූපය මුද්‍රිත කාසිවලින් දේව මාලිගාවේ බද්ද ගෙවීම යුතු බැවිනි.
ii. සීසර් විසින් තම රූපය මුද්‍රිත කාසිය භාවිතා කිරීම තහනම් කර ඇති බැවිනි.
iii. යමෙකුගේ රූපය මුද්‍රිත කාසිය භාවිතා කිරිම තහනම් කර ඇති බැවිනි.
iv. කාසි වර්ගයේ දෙපැත්තේ දේව මාලිගාවේ රූපය හා වටිනාකම් යොදා ඇති බැවිනි.

25. ජේසුතුමා රාජ තේජසින් පෙරුසලමට පිවිසීම සඳහා යොදාගත් කොටළු නාම්බා පිළිබඳ සිදුවීම ගැන සඳහන් වී ඇති පුරාණ දිවැසිවර පාඨයන් වන්නේ,

i. සෙකරියා 19:9
ii. සෙකරියා 9:9
iii. සෙකරියා 19:19
iv. සෙකරියා 9:19

26. ජුදස් විසින් ජේසුස් වහන්සේට ''සිඹීමකින්'' අචාර කරමින් කළ ක්‍රියාව ඇගවූ අර්ථය වූයේ,

i. ජුදෙව් සමාජයේ සිඹීමකින් පිළිගැනීම පුද්ගල ගෞරවය උදෙසා කරන චාරිත්‍රයකි.
ii. පුද්ගලයෙක් ප්‍රේමණීයව පිළිගැනීම උදෙසා සිඹීමකින් ආචාර කිරීමේ චාරිත්‍රයකි.
iii. ජුදස් විසින් ජේසුතුමාට පෞද්ගලිකව ප්‍රේම කළ නිසා එසේ ආචාර කිරීමට.
iv. ජේසුතුමාට නැවත ඔහුට හමු නොවන බැව් දන්නා නිසා කළ ක්‍රියාවකි.

27. පුනර්ජීවනය වූ ජේසුස් වහන්සේ දෙවිඳුන් හා ස්වාමීන් බව ප්‍රකාශ කළ ශ්‍රාවකයා නම්,

i. තෝමස් ය.
ii. පේදුරු ය.
iii. ජොහාන් ය.
iv. පිලිප් ය.

28. කිතුණුවන් ආගන්තුක සත්කාර කිරීමේ දී මුල්තැන දිය යුතු වන්නේ,

i. නැවත අපට සත්කාර කළ නොහැකි දිළිඳු අයට ය.
ii. අපට ඉතා හිතවත් මිතුර මිතුරියන්ට ය.
iii. කලකට පෙර අපට මුණ ගැසෙන නෑදෑ හිතවතුන්ට ය.
iv. අපේ ජාතියට ආගමට හා සමාජ මට්ටමට ගැළපෙන අයට ය.

29. වපුරන්නාගේ උපමාව පරිදි සරුබිමේ වැටුණු බීජ ලෙස කිතුනුවන්,

i. අවංක පවිත්‍ර සිතකින් යුතුව දේව රාජ්‍යයේ සුපුවත අසා පිළිපැද එල දැරිය යුතුය.
ii. ජේසුස් වහන්සේ තුළ අස්වැන්න සරු කොට ගන්නා ආකාරය පිළිබඳව අන්‍යන්ට දේශනා කළ යුතු ය.
iii. ලෝකයට අනුගත දිවි පෙවතක් ගත කරමින් අන් අය දිරිමත් කළ යුතු ය.
iv. අන් අය යටපත් කිරීම තුළ සියලු බාධක මැඩලමින් ජීවිත එලදැරීමකට යොමු විය යුතු ය.

30. කිතුණුවන් තුළ තිබිය යුතු ශ්‍රද්ධාවේ වැදගත්කම පෙන්වීම සඳහා ජේසුස් වහන්සේ විසින් භාවිතා කළ සරල රූපකයකි.

i. ලුණු
ii. බැටළුවන්
iii. කඳු
iv. අබඇටය

31. අරිමාතියේ ජෝසප් ආදර්ශයට ගන්නා අය,
   i. නිවැරදි දැක්මක් ඇතිව ක්‍රියා කිරීමට යොමු විය යුතු ය.
   ii. භේද නොතකා ක්‍රියා කිරීමට නිරතුරුවම ඉදිරිපත් විය යුතු ය.
   iii. සත්‍යයට සාක්ෂි දැරීමට එඩිතරව කැපවිය යුතු ය.
   iv. තමා කරන ප්‍රකාශ පිළිබඳ වගකීම භාරගත යුතු ය.

32. නායකත්ව ධූරාවලියට අදාල ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A. ප්‍රේමයේ ආධිපත්‍ය ක්‍රියාත්මක වේ.
B. නායකයා අනසක පතුරවයි.
C. නායකයා යටත් අයගෙන් සේවය ලබයි.
D. යටත් අය සේවය ලබයි.

මේ අතුරින් දේව රාජ්‍යය තුළ නායකත්ව විදහාපාන ලක්ෂණ වන්නේ,

   i. A හා D ය.
   ii. C හා A ය.
   iii. B හා C ය.
   iv. D හා B ය.

33. කුරුසිපත් ජේසුස් වහන්සේගේ මරණයත් සමඟ සිදුවූ විශේෂ සිදුවීම නම්,
   i. විශාල ආලෝකයක් පැතිරයාම.
   ii. ප්‍රදේශය පුරා පොලෝ කම්පාවක් ඇතිවීමය.
   iii. ගලීල මුහුදේ මාරුතයක් හට ගැනීම.
   iv. දේව මාලිගයේ තිරය දෙකඩවීම.

34. ජේසුස් වහන්සේ කට වචනයෙන් අල්ලා ගැනීම සඳහා සද්දූසිවරුන් විසින් ඉදිරිපත් කරන ලද්දේ,
   i. අධිරාජ්‍යයාට බදු ගෙවීම පිළිබඳ ප්‍රශ්නයයි.
   ii. උපවාසය පිළිබඳ ප්‍රශ්නයයි.
   iii. පුනර්ජීවනය පිළිබඳ ප්‍රශ්නයයි.
   iv. අධිකාරී බලය පිළිබඳ ප්‍රශ්නයයි.

35. උස්ථාන වූ ජේසුස් වහන්සේ තුළ කිතුණු අප සැම විටම ඇති ජයග්‍රාහී බලාපොරොත්තුව වන්නේ,
   i. උන් වහන්සේ සැම විටම කාමකාමී හදවතක් අපට හිමි කර දෙන බවයි.
   ii. උන් වහන්සේ දුක් කම්කටොලු හා වියවුලෙන් තොර ලොවක දිවි ගෙවීමට අපට ඉඩ සලසන බවයි.
   iii. උන් වහන්සේ නිරතුරුවම අප සිතුම් පැතුම් ඉටුකර දෙන බවයි.
   iv. උන් වහන්සේ ජීවමාන සදාකල්ම අප අතර වැඩ වසන බවයි.

36. ''ස්වාමිණී, මා ඔබගේ උපකරණයක් කරගත මැනව'' මෙසේ යාච්ඤා කරන ලද්දේ,
   i. අසීසියේ ෆ්‍රැන්සිස් තුමා විසින්
   ii. සෙකරියස්තුමා විසින්
   iii. කරුණා නිලියම් විසිනි.
   iv. පොලිකාප් තුමා විසිනි.

37. පේදුරුතුමා ඉදිරිපත් කළ මහා ප්‍රකාශනය වූයේ,

   i. ''මා අනුව එන්න මම ඔබ සමඟ සිටිමි.''
   ii. ''ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ ය.''
   iii. ''ඔබ මත මාගේ ගෘහය ගොඩනගමි.''
   iv. ''මම ඔබ නොහඳුනන්නෙමි.''

38. අප ජීවිත ගමනේ දී විවිධ අවස්ථාවල පරීක්ෂාවන්ට මුහුණදීමට සිදු වේ. එවැනි අවස්ථාවල අප ක්‍රියා කළ යුත්තේ,

   i. දේව රාජ්‍ය ගොඩනැගීමටයි.
   ii. පරීක්ෂාවන්ට මුහුණදීමයි.
   iii. ශුද්ධාත්ම මඟ පෙන්වීම සෙවීමටය.
   iv. දේවස්ථානයට යාමට ය.

39. ශුද්ධාත්මයාණන් වහන්සේ පරෙවියෙකුගේ රූපාකාරයෙන් වැඩ සිටීම තුළින් අපට වටහාගත හැකි කරුණ වන්නේ,

   i. ස්නාවක ජොහාන්ගේ පෙරමඟ දූත සේවය අනුමත කිරීමයි.
   ii. ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඉවත්වීමයි.
   iii. ජනතාව භෞතිස්ම ලැබීමයි.
   iv. මේ කිසිවක් නොවේ.

40. මනස්ථාපයේ මඟ තුළ නව ජීවිත ගමනක් යෑමට නම් කිතුණුවා,

   i. ආගමික වත් පිළිවෙත් සඳහා ප්‍රමුඛතාවය දිය යුතු ය.
   ii. නිරතුරුවම දෙවිඳුන් හා ඒකාබද්ධ භාවයට පත්විය යුතු ය.
   iii. තමා තුළ පවතින දැඩි මතවාද හා ආකල්ප වෙනස් කර ගත යුතු ය.
   iv. නව චින්තන විපර්යාසයක නිතැතින් පාත්‍රවිය යුතු ය.

( ලකුණු. 1 x 40 = 40)

**

## II කොටස

**සැළකිය යුතුයි ඃ**

- ❖ **පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**
- ❖ **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

---

01. i. ගලීල මුහුදට .............................. ව්‍යවහාර කරන තවත් නම් දෙකක් ලියන්න.

ii. දිවැසිවරයා යන්න අරුත් ගන්වන්න.

iii. එළිසබෙත් විසින් මරියාණන්ව, ශුද්ධාත්මයෙන් පූර්ණව පිළිගැනීමට කී ප්‍රකාශ දෙකක් ලියන්න.

iv. සෙකරියස්ගේ ප්‍රශංසා ගීයෙන් අවධාරණය කෙරෙන සත්‍යතාවයන් දෙකක් නම් කරන්න.

v. අ). ''ජේසුස්'' යන්නෙහි අරුත නම් කරන්න.

ආ). ජේසු බිළිඳාට මෙම නම දුන්නේ කුමන පිළිවෙත ඉටුකිරීමේ දී ද?

vi. ජේසුතුමා තම මෙහෙවර අරඹන කාලය වන විට පලස්තීනයේ පැවති සමාජ තත්ත්වය ගැන කරුණු දෙකක් ලියන්න.

vii. සද්දූසිවරුන්ගේ මධ්‍යස්ථානය හා සද්දූසිවරුන්ගේ කේන්ද්‍රස්ථානය නම් කරන්න.

viii. නාසරෙත්හි ප්‍රකාශය ලියන්න.

ix. නික්මයාමේ සිද්ධිය හා සම්බන්ධවන වත් පිළිවෙත් කුමක්ද?

x. සිමියොන් දිවැසිවරයා සතු ලක්ෂණ දෙකක් ලියන්න.

( ලකුණු. 2 x 10 = 20)

02. i. ජේසුතුමාගේ දෙමව්පියන් ජේසුතුමා වෙනුවෙන් කලා වූ චාරිත්‍ර දෙකක් නම් කරන්න. ( ල.2)

ii. ඉහතින් ඔබ සඳහන් කළ චාරිත්‍ර අතුරින් එක චාරිත්‍රයක් පිළිබඳව වාක්‍ය තුනක් ලියන්න. ( ල.3)

iii. ජේසුතුමාගේ ජීවිතයේ ඉටුකළා වූ චාරිත්‍රමෙන් ශ්‍රී ලාංකීය ජන ජීවිතය තුළ ඉටුකරන සිරිත් විරිත් චාරිත්‍ර කිතුණු අනන්‍යතාව රැකගෙන කෙසේ ඉටු කරන්නේදැයි කරුණු දක්වමින් විග්‍රහයක යෙදෙන්න. ( ල.5)

03. i. ජේසුතුමාට විරුද්ධව චෝදනා විභාග කිරීමට එතුමාව රැගෙන ගිය ස්ථාන දෙකක් සඳහන් කරන්න. (ල.2)

ii. ජේසුතුමාට විරුද්ධව රෝම ආණ්ඩුකාරයා ඉදිරියේ ඉදිරිපත් කරන ලද රාජ්‍ය විරෝධී චෝදනා තුනක් නම් කරන්න. ( ල.3)

iii. ජේසුස් වහන්සේගේ මරණය සිදු වූ ආකාරය, එයට නිහඬව එතුමා මුහුණ දුන් අභියෝගාත්මක සංසිද්ධිය තුළින් අප ලබන ජීවිත ආදර්ශය ගැන විග්‍රහයක යෙදෙන්න. ( ල.5)

04. ''සීසර්ගේ දේ සීසර්ටත් , දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දෙන්න.

i. මෙය පැවසීමට හේතු වූ අවස්ථාව කුමක් ද? (ල.2)

ii. ජේසුස් වහන්සේ දුන් එම පිළිතුරෙන් අදහස් කළේ කුමක් ද? ( ල.3)

iii. ජේසුස් වහන්සේගේ එම ප්‍රකාශයෙන් අද අපට ඉදිරිපත් කරන පණිවිඩය පිළිබඳ කරුණු ගෙනහැර දක්වන්න. ( ල.5)

05. ''ජේසුස් වහන්සේ ප්‍රාතිහාර්යයන් හෙවත් ආශ්චර්යවත් ක්‍රියා සිදුකරන ලද්දේ දේව රාජ්‍යයේ ලකුණු වශයෙනි ''

i. ප්‍රාතිහාර්යය යන්න හැඳින්වීම සඳහා සුබසුන් කතුවරුන් යෙදූ ග්‍රීක නාමයන් නම් කරන්න. ( ල.2)

ii. දේව රාජ්‍යයේ ලකුණු හෙවත් ප්‍රාතිහාර්යය කාණ්ඩ හතරකට බෙදේ. ඉන් කාණ්ඩ තුනක් නම්කර, එම කාණ්ඩ සඳහා බයිබල් උදාහරණ දක්වන්න. ( ල.3)

iii. ඔබේ ජීවිතයේ ප්‍රාතිහාර්යය අත්දැකීම් සඳහා බව ක්‍රියා කළ යුතු ආකාරය හා ඒ සඳහා ඔබතුල වර්ධනය කරගත යුතු ගුණාංග කෙටියෙන් විස්තර කරන්න. ( ල.5)

06. කිතුණු අපගේ ජීවිතවල මූලික අරමුණ විය යුත්තේ ''දේව රාජ්‍යය'' උරුමකර ගැනීමයි.

i. ලෞකික රාජ්‍යය හා දේව රාජ්‍යය අරුත් ගන්වන්න. (ල.2)

ii. දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳ ඉගැන්වීම සඳහා ජේසුතුමා යොදාගත් උපමා තුළින් ඉදිරිපත් කරන ප්‍රධාන ඉගැන්වීම බැගින් ලියන්න. ( ල.3)

iii. දේව රාජ්‍යයේ වර්ධනයට දායකවීම සඳහා ඔබට කළහැකි ක්‍රියාකාරකම් පහක් නම් කර එය කෙටියෙන් හඳුන්වන්න. ( ල.5)

07. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න. ( මාතෘකාවන්ට අදාල අනු මාතෘකා යටතේ කරුණු ගොනු කරන්න. )

i. ස්නාවක ජොහාන්තුමාගේ පෙර මඟ දූත සේවය.

- ස්නාවක ජොහාන්ගේ ළමා කාලය
- කැඳවීම හා සේවය ආරම්භය
- සේවය සඳහා සූදානම්වීම.
- ඉදිරිපත් කළ විශේෂ වදන්
- ඔහුගේ පෙර මඟ දූත සේවය.

ii. රාජ්‍ය තේජසින් පෙරුසලමට පැමිණීම.

- රජෙක් සේ පෙරුසලමට පැමිණීම.
- දේව මාළිගාව පවිත්‍ර කිරීම.
- ජේසුතුමා කී වදන්
- එකළ පේරුසලමේ මාළිගාවේ පැවති වංචනික ක්‍රියා

iii. ජේසුතුමා විනිශ්චය කිරීම.

- ජේසුතුමා විනිශ්චය සඳහා ගෙනගිය ස්ථාන පිළිවෙලින්
- එතුමාට එල්ල වූ චෝදනා
- එතුමාට දඬුවම ලෙස මරණ දණ්ඩනය හිමිවීම.
- එතුමා ප්‍රකාශ කළ විශේෂ ප්‍රකාශ

iv. භාග්‍ය හා අභාග්‍ය

- භාග්‍ය හා අභාග්‍ය දේශනා කිරීම සඳහන් ශුභ ආරංචි ග්‍රන්ථය
- භාග්‍ය කිහිපයක් හා අභාග්‍ය කිහිපයක්
- භාග්‍ය හා අභාග්‍ය අර්ථවත්ව ප්‍රකාශ කිරීමකි. උපමා කතා

v. ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂාව

- ජේසුතුමාට පැමිණි පරීක්ෂා පිළිවෙළින්
- එම පරීක්ෂා ජය ගැනීමට ජේසුතුමා කී පිළිතුරු වදන් හා එම වදන් උපටාගත් බයිබල් ලියවිලි පාඨ
- එදිනෙදා ජීවිතය ගත කරන අපට පැමිණෙන පරීක්ෂා
- එම පරීක්ෂා ජය ගැනීමට අප විසින් කළ යුතු ක්‍රියාවන්

vi. ධර්මදූත සේවය සඳහා පිටත්ව යාම.

- එසේ ධර්මදූත සේවය සඳහා කණ්ඩායම් යැවීමට හේතු
- කී දෙනා බැගින් යවන ලදීද?
- ඉදිරිපත් කළ ප්‍රකාශ
- පැවරූ කාර්යයන්
- චාරිකාවලදී ලද ප්‍රතිඵල

***

# ක්‍රිස්තියානි ධර්මය
## 10 ශ්‍රේණිය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | iv | 11. | iii | 21. | ii | 31. | iii |
| 02. | i | 12. | iv | 22. | ii | 32. | i |
| 03. | iii | 13. | ii | 23. | iv | 33. | iv |
| 04. | ii | 14. | iii | 24. | iii | 34. | iv |
| 05. | ii | 15. | iv | 25. | ii | 35. | iv |
| 06. | iii | 16. | iii | 26. | i | 36. | i |
| 07. | ii | 17. | iv | 27. | ii | 37. | ii |
| 08. | iv | 18. | iii | 28. | i | 38. | iii |
| 09. | ii | 19. | iii | 29. | i | 39. | i |
| 10. | i | 20. | iii | 30. | iv | 40. | ii |

### II කොටස

01. i. ගලීල මුහුද, තිබේරියස් මුහුද, ගෙනසෙරෙත්විල

ii. දෙවියන් වහන්සේ කැඳවීම තුල, දේවාත්මානුභාවයෙන් එළිදරුව් කරන ලද දේව පණිවිඩය ජනතාවට පිළිගැන්වූ තැනැත්තිය.

iii. ''ඔබ වනිතාවන් අතර ආශිර්වාද ලද්දී ය.''

''මාගේ ස්වාමීන් වහන්සේගේ මෑණියන් '' යන ලෙස ය

iv. එම උපත් තුළින් දෙවි සමිදාණන් ජනතාවගේ විමුක්ති යසලසන බව

තම පුත්‍රයාගේ මෙහෙවර වනුයේ ජනතාව මනස්ථාපනයට කැඳවීම බවද

v. අ). දෙවියන් වහන්සේ මුදාන සේක '' යනුයි

ආ). චර්මඡේදන පිළිවෙත ඉටුකිරීමේ දී ය.

vi. සාමන්‍ය ජනතාව දේශපාලනයක හා සමාජීය ආර්ථික වශයෙන් දැඩි පීඩාවකට ලක්ව සිටීම.

අවු. 60 කට වඩා වැඩි කාලයක් යුතුකමක් ලෙසටත් පිහිටි අතර අධික බදුබරකට ලක්වීම.

vii. පරිසිවරු - ධර්මශාලා
සද්දාසිවරු - ජේරුසලම දේවමාලිගාව

viii. ස්වාමීන් වහන්සේගේ ආත්මිය මා කෙරෙහි ඇත.
කුමක් හෙයින් ද දිළින්දන්ට ආහාර

ix. කුළුදුලන් කැප කිරීම.

x. දැහැමි බැතිමතෙකි / ශුද්ධාත්ම වැඩ විසීම අත්දුටුවෙකි.

02. i. පාඩම 5 - 10 ශ්‍රේණිය, චර්මඡේදනය, කැප කිරීම, අවු. 12 ජේරුසලම දේව මාලිගාවට යාම.

ii. පාඩම 10 තුළින් 16,17 පිටු අනුව ලකුණු පවරන්න.

iii. ජේසුතුමාගේ ජීවිතයේ මෙන් වර්තමානයේ ඉටුකරන චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ ඔබ ඉටුකරන අයුරු පහක් ලිවීම ප්‍රමාණවත්

03. i. උත්තම පූජකයාගේ මැදුර / ශ්‍රේෂ්ඨාධිකරණය / ජුදයේ රෝම ආණ්ඩුකාරයා ( පිලාත් ) / හෙරොත් රජ / නැවත ජුදයේ රෝම ආණ්ඩුකාරයා

ii. රාජ්‍ය විරෝධී චෝදනා - ජාතිය කැරළි ගැසීමට පෙළඹවීම.
අධිරාජ්‍යයට බදු ගෙවීම තහනම් කිරීම.
තමා ක්‍රිස්තුස් නම් රජකු බව ප්‍රකාශ කිරීම.

iii. 10 ශ්‍රේණිය 14 පාඩමට අදාලව සමස්ථය තුළින් දරුවා ඉදිරිපත් කරන කරුණුවලට ලකුණු පවරන්න.

04. i. අධිරාජ්‍යයාට බදු ගෙවීම යුතු ද අයුතු ද යන පැනය ඇසූ අවස්ථාව

ii. දේව රාජ්‍යය කිසිසේත් ලෞකික රජ්‍යයකට සමාන කළ නොහැකි බවත්, දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේට දීම යනු අපගේ මුළු ජීවිතයෙන්ම උන් වහන්සේට සේවය කිරීමයි.

iii. 10 ශ්‍රේණිය 11 පාඩමට අදාලව දරුවන් දී ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න.

05. i. ශු. මතෙව්, ශු. මාක්, ශු ලූක් කතුවරුන් - ඩුනෝමිස් යන ග්‍රීක වදන
ශු. ජොහාන් තුමා - සෙමෙයොන්

ii. සුව කිරීම් - ජෙරිකෝවේ අන්ද මිනිසා සුව කිරීම.
ශුද්ධාත්ම දුරු කිරීම් - ගෙරසේන රටේ යක්ෂයන් දුරු කිරීම.
ස්වභාව ධර්මයා අභිබවා කළ ක්‍රියාවන් - පන්දහසකට කෑම දීමේ සිද්ධිය
මරණින් උත්ථාන කිරීම් - නායින්නුවර වැන්දඹුවගේ පුත්‍රයා මරණින් උත්ථාන කිරීම.

iii. 10 ශ්‍රේණිය 21 පා ඩමට අදාලව ළමුන් ලියා ඇති කරුණු සඳහා ලකුණු පවරයි.

06. i. ලෞකික රාජ්‍ය, නායකත්වයක් හිමි, ආධිපත්‍යක්, බලයක් ඇති, නිශ්චිත භූමි සීමාවක් ඇති, නීති මාලාවක් ඇති පුරවැසියන් ජීවත්වන රාජ්‍යයකි.
දේව රාජ්‍ය යනු දෙවියන් වහන්සේ සතු ආධිපත්‍ය, දෙව්පියා දරන නායකත්වය දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටුකරන ජනතාව, භූමි ප්‍රදේශය වනාහි මුළු විශ්වයම වේ..... වැනි පිළිතුරු වලට ලකුණු කරයි. (මෙම අදහස් ගම්‍යවන පිළිතුරු වලට ලකුණු දෙන්න)

ii. අඹ ඇටය - කුඩා අඹ ඇටය වර්ධනය වී ගසක් වීම දක්වා වර්ධනය විශ්මිතයි. දේව රාජ්‍ය ප්‍රවර්ධනයත් එසේ ය.
මුහුන් පිළිබඳ - කුඩා මුහුන් පිඩි පිටි පිපීමට යොදා ගත් පසු පිටතට නොපෙනෙනා අන්තර් ක්‍රියාකාරිත්වය විශ්මිතයි.
වපුරන්නා - දේව රාජ්‍යයේ වර්ධනයට කුමන බාධක, තහංචි, පීඩා පැමිණුනත් දේව පියා විශ්මිත ලෙස එය වර්ධනය කිරීමට ඉඩ සලසන බව.

iii. දරුවන් ලියා ඇති කරුණුවලට ලකුණු පවරයි.

07. i. ස්නාවක ජොහාන්ගේ පෙරමග සේවය - **10 ශ්‍රේණිය, 6 පාඩම**

- එළිසෙබෙත් හා සෙකරියස්ගේ දෙමාපියන් වන අතර ඔවුන්ගේ මහළු වයසේදී ලැබුණු දරුවා වන්නේ ස්නාවක ජොහාන් ය.
- කුඩා කල පටන් එතුමා ජේසුතුමාත් පෙරමග දූත සේවයට සූදානම් කළා.
- පොදු ජනතාවට, රාජ්‍ය සේවයේ යෙදී සිටි අයට, ආරක්ෂක අංශයට, ජුදා ආගමික ජනතාවට තම ජීවිත වෙනස්වීමට කළයුතු දේ පිළිබඳ විස්තර

ii. රන් තේජසින් පේරුසලමට පිවිසීම. - **10 ශ්‍රේණිය, 12 පාඩම**

- ජයාන්විතව කොටල් නාම්බෙකුගේ පිටේ පේරුසලම දේව මාලිගාවට යාම.
- නෝසන්නා ! ලෙස ජයගෝසා නාදය සමඟ ජේසුතුමා පේරුසලමට පිවිසීම.
- පේරුසලම දේව මාලිගාව සොරුන්ගේ ගුහාවක් ලෙස පැවතීම හා එය පවිත්‍ර කිරීම.
- එකළ පේරුසලම මාලිගාව පැවතියේ වංචනික ලෙස ය. ගණුදෙනු සිදුවිය.

iii. ජේසුතුමා විනිශ්චය කිරීම. - **10 ශ්‍රේණිය, 14 පාඩම**

- උත්ම පූජක නිල නිවස, ශ්‍රේෂ්ඨාධිකරණය, පිලාත් ඉදිකිරීම, හෙරොද් ඉදිරියේ, නැවත පිලාත් ඉදිරියේ ඔබ ක්‍රිස්තුස් ද? ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා ද?
- ජාතිය කැරළි ගැසීමට පෙළඹවීම.
- අධි රාජ්‍යයට බදු ගෙවීම තහනම් කිරීම.
- තමා ක්‍රිස්තුස් නම් රජෙක් බව

iv. භාග්‍ය අභාග්‍ය -

- ශු. මතෙව් හා ශු. ලූක් සුවිශේෂයෙහි ඇති භාග්‍ය හා අභාග්‍ය පිළිබඳ විස්තරය.
- භාග්‍ය හා අභාග්‍ය කිහිපයක වදන්
- භාග්‍ය හා අභාග්‍ය පිළිබඳව අර්ථවත්ව ප්‍රකාශ කිරීමකි. අත්තිවරම් 2 උපමා කතාව පිළිබඳ කරුණු කිහිපයක්.

v. ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා - **10 ශ්‍රේණිය, 18 පාඩම**

- ගල් රොටී වෙන්නට අණ කිරීම. මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවේ යැයි ලියා තිබේ. ( ද්වීතිය නීති සංග්‍රහය 3 :3 )
- පිටුව 79, 80, 81
- එදිනෙදා ජීවිතයේ දී අපට පැමිණෙන පරීක්ෂා - ළමයින්ගේ පිළිතුරු වලට ලකුණු කරයි. (ද්වීතිය නීති සංග්‍රය 6 :13 )
- දේව මාලිගාවේ කොත මුදුණින් පැමිණීම.
- එදිනෙදා පැමිණෙන පරීක්ෂණ වලින් ජය ගැනීමට නම් අප විසින් නිතර යාච්ඤාවෙන් ජීවත් විය යුතු ය.

vi. ධර්මදූත සේවය සඳහා පිටත්ව යාම.

- තම ශ්‍රාවකයින් ප්‍රායෝගික ලෙස පුහුණු කරමින් දේව රාජ්‍යය පිළිබඳ සුභ අස්න ප්‍රකාශ කිරීම සඳහා එසේ චාරිකා සූදානම් කළ සේක.
- ශ්‍රාවකයා 12, 70 බැගින් '' මග වලසුන් මැදට යවමි ''
- පිටුව 33 ( 10 ශ්‍රේණිය අනුව ලකුණු දෙන්න )
- රටපුරා සුභ අස්න ප්‍රකාශවීම.
- දෙවියන් වහන්සේගේ නාමය තුළ රෝගීන් සුවය ලැබීම.

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**